

# කොකිඩාමා

KOKEDAMA



බොහෝ විට ඔබ කවදාවත් ජපන් කොකිඩාමා (Kokidama) උද්‍යානයක් ගැන අහලා නැතිව ඇති. ඒත් මේ ලිපිය කියෙව්වට පස්සේ නම් ඒ ගැන ඔබට උනන්දුවක් ඇතිවන බව මට ඇත්තටම සහතික කරන්න පුළුවන්. මෙය බොහෝ විට එල්ලෙන උද්‍යානයක් ලෙස පවතින අතර ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක වුවද නිර්මාණය කරගන්න ඔබට පුළුවන්. එමෙන්ම මෙය ඉතාමත් අඩු මුදලකට සදාගැනීමට හැකි වීමත් ඉතාම වැදගත්. මෙහිදී ඔබ කැමති පැළය මෘදු පාසි මඟින් ආවරණ කරන ලද මඩ පන්දුවක සිටුවා ඉහළ එල්ලා තැබීම සිදු කරනු ලැබේ.

දැන් ඔබ පිළිගන්නවානම් මෙය ඔබේ නිවස අලංකාර කර ගැනීමට ඉතා හොඳ විසඳුමක් ලෙස පහත පියවර අනුගමනය කිරීමෙන් ඔබට ඔබේම අලංකාර කොකිඩාමා උද්‍යානයක් නිර්මාණය කරගන්න පුළුවන්

ඔබ සූදානම් නම් පහත ද්‍රව්‍ය ටික මුලින්ම එකතු කරගන්න. මම කියන්නම් හදන විදිය.

- ඔබ කැමති ආකාරයේ පැළයක්
- බොන්සායි මාධ්‍ය
- කොම්පෝස්ට් මාධ්‍යය
- මෘදු පාසි
- ලණුවක්/ ගෝනි නූලක්

හරිනේ, දැන් බලමු, කොහොමද කොකිඩාමා හදාගන්නේ කියලා.

### පියවර 01



මුලින්ම බොන්සායි මාධ්‍ය 70% ත් කොම්පොස්ට් සහ මැටි 30% ත් අනුපාතය එන ලෙස හොඳින් මාධ්‍යය මිශ්‍ර කර ගන්න. දැන් මිශ්‍රණයට ජලය යොදමින් මිශ්‍රකර රූප සටහනේ පරිදි (අග්ගලා ගුලියක් ආකාරයට) පන්දුවක් සදාගන්න.



පස් පන්දුව සෑදීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ඔබට කියන්න ඕන. පළමු කරුණ තමයි පන්දුවෙන් පිටට පස් වැටෙන්න දෙන්න එපා. ඒ වගේම ශාක මුල් වලට වර්ධනය වන්න පහසු ආකාරයට තද නොකර සදා ගන්නත් ඕන.

### පියවර 02

පන්දුව සදා අවසානයේ මිට මොලවා පන්දුව තුළ රූප සටහනේ පරිදි සිදුරක් සදා ගන්න.



### පියවර 03



තෝරාගත් පැළයේ මුල් වල පවතින අනවශ්‍ය පස් සීරුවෙන් ඉවත් කර එය සාදාගත් පස් පන්දුවේ සිදුරු තුළ තබා පැළය වටේම පස් දමා සීරුවට තද කරන්න. දැන් ඔබේ ළඟ තිබෙන පැළය සිටුවා අවසන්.

## පියවර 04

පස් බෝලය පරිස්සමින් පාසි වලින් ආවරණය කර සෙමින් තද කරන්න. පාසි වැටෙයි කියලා බයවෙන්න එපා. මොකද නූල් වලින් පාසි ඔතන නිසා පාසි වැටෙන්නෙ නෑ. තවද පන්දුව වටේට පාසි තබන්න පෙර තෙත ගෝනියක් ඔතලා ඒ වටේට පාසි ඔතන්න ඔබට පුළුවන් නම්, අලංකාරය තවත් වැඩි කරගන්න පුළුවන්.



## පියවර 05

නූල් වලින් පන්දුව එතීමේදී සැලකිලිමත් වෙන්න ඕන තවත් කාරණයක් තමයි පන්දුවේ පැති සියල්ල හා පහළ කොටස හොඳින් ආවරණය වන පරිදි නූල් වලින් එතීම. ඉන් පසුව පන්දුව තවත් ලණුවක් අධාරයෙන් ඉහළට එල්ලීමට සූදානම් කරගන්න.

සෙවණ සහිත ස්ථානයක ඉහළට එල්ලෙන පැළයකට නම් ජල ඉසිනයක් භාවිතා කර ජලය ඉසින්නත් පුළුවන්. එහෙමත් නැතිනම් ජල භාජනයක ගිල්වා වැඩිපුර ජලය වහනය වීමට සැලැස්වීමෙන් කොකිඩාමා වලට ජලය සම්පාදනය කරන්නත් පුළුවන්.

### වැදගත් :

**ඔබට ලස්සන කොකිඩාමා උද්‍යානයක් අවශ්‍ය නම් පැළ තේරීමේදී ඉතාමත් සැලකිලිමත් වීමට මතක තබා ගත යුතුයි. එයට හේතුව තමයි මෙයට සෙවණ ප්‍රිය ශාක තෝරා ගැනීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල නෙලාගන්න පුළුවන් වීම.**

ඒ වගේම තමයි කොකිඩාමා භාවිතා කරන්න පුළුවන්, විවිධ විධි තියෙනවා. එය ඔබට වැදගත් වෙයි. ඒ නිසා මම කියන්නම් එය ඔබේ නිර්මාණශිලිත්වය මත වෙනස් කරන්න පුළුවන් කියලා. මෙය ඔබට අවශ්‍ය නම් නිවස තුළත් හැකි නම් පිටත අලංකරණය සඳහාත් යොදා ගන්න පුළුවන්. ඇතුළත නම් එය කාර්යාලයට, කෑම කාමරයේ මේසය මැදට එන සේ, මුළුතැන්ගෙට, බැල්කනියට, නාන කාමරයට වැනි ඕනෑම සුදුසු ස්ථානයකට යොදා ගන්න පුළුවන්. ඒ වගේම තමයි ඉහළ එල්ලීමට අමතරව පැතලි ස්ථානයක තැබීම, අලංකාර බඳුනක තැබීම, දිරපු කඳන් සමඟ නිර්මාණශිලිව තැබීම, අවස්ථානුකූලව තැගි දීමටත් එහි ඕනෑම සුදුසු ආකාරයකට යොදා ගන්නත් පුළුවන්.

**ගොවිකම් සඟරාවට එක් කළේ,**

**එන්. ඩබ්. වී. උදාරි ශෂිකලා සෞම්‍යා කුමාරි**
**සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන),**
**ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය,**
**අඟුණකොළපැලැස්ස.**